# උත්ථාන සමයේ පස්වන සතිය
# සිකුරාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයෙකි.

ක්‍රියා 15 : 22 – 31

**"අවශ්‍ය දේ හැර අන් කිසි බරක් ඔබ පිට නොපැවරීම ශුද්ධාත්මයාණන්ටත් අපටත් යහපතියි පෙනේ."**

එකල තමන් අතරෙන් නියෝජිතයන් තෝරාගෙන, ඔවුන් පාවුලු සහ බාර්ණබස් සමග අන්තියෝකියට යැවීම යහපතැ යි අපෝස්තුළුවරුන්ට ද සහා මූලිකයන්ට ද මුළු සභාවට ද පෙනී ගියේය. තෝරාගනු ලැබුවෝ නම් සහෝදරයන් අතර මූලිකයන් වන බාර්ණබස් නම් ලත් ජුදස් සහ සීලස් ය. ඔවුන් අත මෙසේ ලියා යවන ලදි.

"අපෝස්තුළුවරු ද සහෝදර සහා මූලිකයෝ ද වන අපි අන්තියෝකියෙහිත්, සිරියාවෙහිත්, සිලිසියාවෙහිත්, වසන විජාතී වූ සහෝදරයන් වෙත සුබ පතමින් මෙසේ ලියා එවමු. අපේ අනුමැතිය නොලත් සමහරෙකු අප අතරෙන් පිටත්ව ගොස් නොයෙක් දේ කියා ඔබ කලඹමින් ඔබගේ සිත් අවුල් කළ බව අපි ඇසීමු. එහෙයින් තමන්ගේ දිවි නොතකා, අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමය නිසා, ජීවිත කැප කළ අපගේ ප්‍රේමනීය බාර්ණබස් ද පාවුලු ද සමග නියෝජිතයන් තෝරාගෙන ඔබ වෙතට එවීම සුදුසු යැයි රැස්වූ අපගේ ඒකමතික තීරණය විය. එහෙයින් ජුදස් ද සීලස් ද ඔබ වෙත එවමු. ඔවුන් මේ කාරණාම ඔබට කට වචනයෙන් ද කියනු ඇත. එනම් දේව පිළිමවලට පිදූ දෙයින් ද ලෙයින් ද බොටුව මිරිකා මැරූ සතුන් කෑමෙන් ද කාමමිථ්‍යාචාරයෙන් ද ඔබ වැළකිය යුතු බව මිස, වෙන කිසි බරක් ඔබ පිට නොතැබීම යහපතැ යි ශුද්ධාත්මයාණන්ටත් අපටත් පෙනී ගියේය. ඔබ මේවායින් වළකින්නහු නම් යහපති. ඔබට සෙත්වේවා."

මෙසේ යවනු ලැබූ ඔව්හු අන්තියෝකියට පැමිණ, සමූහයා රැස් කරවා, ලිපිය භාර දුන්හ. සමූහයා එය කියවා ඒ අනුශාසනාව ගැන ප්‍රීති වූහ.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 57 : 7-11

පිළිතුර: අහෝ සමිඳුනි, මම ජනතාව අතර ඔබ පසසමි.

ගීය:

අහෝ දෙවිඳුනි, මට අචල විශ්වාසයක් ඇත්තේ ය.
මම ගී ගයා ඔබ පසසමි.
මාගේ හදවත අවදි වන්න! එම්බා! කුඩා වීණාව, මහා වීණාව, පිබිදෙන්න! එවිට මම උදා හිරු අවදි කරන්නෙමි.

අහෝ සමිඳුනි, මම ජනතාව අතර ඔබ පසසමි.
විජාතීන් අතර මම ඔබට ගී ගයමි.
ඔබේ කරුණාව සග ලොව දක්වා නගින්නේය. ඔබේ සත්‍යවාදීකම අහස උසට නැඟී ඇත්තේය.

දෙවිඳුනි, අහසට වඩා ඔබේ ශ්‍රේෂ්ඨත්වය උසස් බව දැක්වුව මැනව.
ඔබේ මහිමාලංකාරය ලොව පුරා පැතිරේවා!

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"මාගේ බැටළුවෝ මාගේ කටහඬ අසති.
මම ද ඔවුන් අඳුනමි.
ඔව්හු ද මා පසු පස්සේ එති" යි ස්වාමින් වහන්සේ වදාරණ සේක.
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම්තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 15 : 12-17

**"මා ඔබට දෙන පණත මේ ය.**
**ඔබ එකිනෙකාට ප්‍රේම කරන්න."**

"මාගේ ආඥා නම් 'මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න' යනුයි. යමෙකු තමාගේ මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවෙකුට නැත. මා ඔබට අණ කරන දේ ඔබ කරන්නහු නම්, ඔබ මාගේ මිතුරෝ ය. මෙතැන් පටන් මම ඔබට දාසයෝ ය යි නොකියමි. මන්ද, දාසයෙක් තමාගේ ස්වාමියා කරන්නේ කුමක් දැයි නොදනී. එහෙත්, මාගේ පියාණන් වහන්සේගෙන් මා ඇසූ සියල්ලම ඔබට දන්වා වදාළ බැවින් මම ඔබට මිත්‍රයෝ යැයි කීවෙමි. ඔබ මා තෝරා ගත්තේ නැත. මම ඔබ තෝරාගෙන පත් කළෙමි. එසේ කළේ ඔබ ගොස් බොහෝ පල දරන පිණිසත්, ඔබේ පල පවතින පිණිසත් මාගේ නාමයෙන් ඔබ පියාණන් වහන්සේගෙන් ඉල්ලන කවර

දෙයක් වුව ද උන්වහන්සේ ඔබට දෙන පිණිසත් ය. මා ඔබට අණ කරන දේ මේ ය, එකිනෙකාට ප්‍රේම කරන්න.”

සුවිශේෂ වාක්‍යය එසේය.